# 18. කෘෂිකාර්මික ඉඩම් පරිහරණය කෙරෙහි ඉඩම් අයිතියේ සහ භුක්තියේ බලපෑම (මහවැලි 'එච්'කලාපය ඇසුරින්)

එම්. එම්. එස්. ජ්. මාරසිංහ, කථිකාචාර්ණි, සමාජීය විද්‍යා අධ්‍යනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලය. E-Mail: samalimarasinghe@yahoo.com

**සංක්ෂේපය**

ඉඩම් අයිතියේ ස්වභාවය ගත් විට ඉතා සංකීර්ණ එකකි. එය කාලයෙන් කාලයට, පාලන ක්‍රමය අනුව ද වෙනස් විය හැකිය. බ්‍රෝම්ලි (Bromley) විසින් 1989 දී ඉඩම් අයිතිය පිළිබඳව සංකල්ප 04 ක් හඳුන්වා දී ඇත. පොදු දේපල අයිතිය, පෞද්ගලික අයිතිය, විවෘත අයිතිය සහ රාජ්‍ය අයිතිය වශයෙනි. මෙම ඉඩම් අයිතිය මෙරටට පොදු බව ශ්‍රී ලාංකේය අතීතය, වර්තමානය පරීක්ෂාකර බැලීමේ දී පැහැදිළි වේ.

ඉඩම් 'අයිතිය' සහ 'භුක්තිය' යනුවෙන් අදහස් කරන්නේ එකම තේරුම ඇති වචන දෙකක් නොව අර්ථ නිරූපන දෙකක් සහිත එකකි. අයිතිය යනු නීත්‍යානුකූලව යම් පුද්ගලයෙකුට ලැබෙන හිමිකමකි. නමුත් භුක්තියේ දී අයිතියක් නොමැතිව වුවද භුක්ති විඳිය හැකි ය. එය ගිවිස ගන්නා ආකාරය අනුව වෙනස් වේ. ශ්‍රී ලංකාවේ ඉඩම් අයිතිය රෝම ලන්දේසි නීතියේ සඳහන් වන ආකාරයට අර්ථ දක්වා ඇත. පසුකාලීනව එය වරින් වර ව්‍යවස්ථාදායක සභාවේ සහ පාර්ලිමේන්තුවේ නීතිගත කෙටුම්පත් මඟින් සංශෝධනය වී ඇත. 'අයිතිය' (Ownerhip) යන්නෙහි සරල අර්ථය වන්නේ මිලදී ගැනීම හෝ ප්‍රධානයන් මඟින් හෝ ඉඩමක් අතින් අත මරු වූ විට එම ඉඩම පිළිබඳ සියලුම නෛතික අයිතීන් මිලයට ගනු ලැබූ හෝ ප්‍රධානය ලබා ගත් පාර්ශවයට හිමි වේ. විවිධ නීති කෙටුම්පත් තුළින් ඇතැම් ඉඩම් පවරා ගැනීමකට රජයට අයිතිය තිබුණු බව ශ්‍රී ලංකාවේ ඉඩම්වලින් 80% ක් පමණ රජයට අයත් වීමෙන් පැහැදිළි වේ ( Report of the Land commission, 1987).

මීට අමතරව දේපල හිමිකම (Property Rights) යන්නෙන් අදහස් කරනුයේ ආර්ථිකයක සම්පත් භාවිතයේදී එම සම්පත් හා පුද්ගලයන් අතර පැවතිය යුතු සම්බන්ධතාවය අර්ථ දක්වන නීතිරීති, සම්ප්‍රදායන්, සමාජ පිළිගැනීම් සහ වටිනාකම්වලින් සමන්විත සංකීර්ණ ප්‍රපංචයකි (අබේගුණවර්ධන, සේනාරත්න, 2002: 109). වර්තමාන සමාජයේ දේපල අයිතිය ප්‍රධාන වශයෙන් නීතිමය ක්‍රියාදාමයක් මඟින් ක්‍රියාවට නැගෙයි. මෙහිදී විවිධ සම්පත් භාවිතය සම්බන්ධයෙන් පුද්ගලයන් හෝ පුද්ගල කණ්ඩායම් සතුවන අයිතිවාසිකම්, වරප්‍රසාද මෙන්ම එම අයිතිවාසිකම්වල සීමාවන්ද එම සීමාවන් උල්ලංගනය කිරීමට එරෙහිව පැනවෙන දඬුවම්ද අර්ථ දක්වෙයි.

මෙම පර්යේෂණයේ ප්‍රතිඵල පහත සඳහන් ආකාරයෙන් පෙන්වා දිය හැකිය. එහිදි ශ්‍රී ලංකාවේ අතීතයේ සිට වර්තමානය දක්වා ඉඩම් අයිතිය සහ භුක්තිය ශ්‍රී ලංකා සමාජය තුළ වෙනස් වන ආකාරය විශ්ලේෂණාත්මකව ඉදිරිපත්කර ඇති අතර

ඉඩම් අයිතිය වෙනස් වීමෙන් භූමි සංරක්ෂණය වෙනස්වන ආකාරයත් එමගින් පැන නැගී ඇති වත්මන් ගැටලු වන ඉඩම් අහිමි වීම, විරැකියාව, අඩු ඵලදායිතාවය වැනි කරුණු හඳුනා ගත හැකිය.

යොමු වචනඃ කෘෂිකාර්මික ඉඩම්, ඉඩම් අයිතිය සහ බුක්තිය, මහවැලි එච් කලාපය, ශ්‍රී ලංකාව

**හැඳින්වීම.**

ඈත අතීතයේ සිටම මිනිස් වර්ගයාගේ පැවැත්මටත්, ඉදිරි ගමනටත් තීරණාත්මක සාධකයක් වූයේ භූමියයි. මේ නිසා ඉඩම් සම්බන්ධ ගැටළු හා ප්‍රතිපත්තීන් කාලය, දේශය, සහ සමාජ ආර්ථික ක්‍රම අතර ඇති වෙනස්කම් නොසලකමින් එදා මෙදා තුර මානව සමාජයේ කේන්ද්‍රීය ස්ථානයක් අත්පත් කරගෙන ඇත. පාලකයෙකුගේ රාජ්‍යයක හෝ සමාජ ආර්ථික ක්‍රමයක පවා සාර්ථකත්වය හා අසාර්ථකත්වය බොහෝදුරට රැඳී පවතින්නේ ද 'භූමිය' පිළිබඳව නිවැරදි අවබෝධයක් ඇත්නම් පමණි. මැතර් (Mather) විසින් 1986 දි භූමිය පිළිබඳව දැක්වූවේ භූමිය මිනිසාගේ වාස භවනයි. එය මිනිසාගේ ජීවිතයට, පැවැත්මට සහ මරණයට හේතුවේ යනුවෙනි. මේ අනුව බැලීමේ දී ජීවිතයට භූමිය ඉතා වැදගත් සාධකයක් වන අතරම ශ්‍රී ලංකාව වැනි කෘෂිකාර්මික අඩිතාලමක පිහිටි රටක එය ධන සම්පත් අතර ප්‍රධාන වේ. ශ්‍රී ලංකාව තුළ පැන නැඟී ඇති සේවා වියුක්තිය, ආහාර සපයා ගැනීමේ ගැටළුව පමණක් නොව ආනයන හා ගෙවුම්ශේෂ ප්‍රශ්න වලදී ද කෘෂිකාර්මික ඉඩම් වඩාත් ඵලදායී ලෙස යොදා ගැනීමේ වැඩපිළිවෙළ වඩාත් යෝග්‍ය වී ඇති බව පසුගිය අඩ සියවස තුළ දක්නට ඇති කරුණකි. ඒ නිසාම භූමියේ අයිතිය නිශ්චිත වූත් නිරවුල් වූත් එකක් බවට පත් කිරීම තුළ ලබාගත හැකි ප්‍රතිලාභ ද ඉතා ඉහළ මට්ටමකට පත් විය හැකි ය.

ඉඩම් අයිතියේ ස්වභාවය ගත් විට එය ඉතා සංකීර්ණ එකකි. එය කාලයෙන් කාලයට, පාලන ක්‍රමය අනුව ද වෙනස් විය හැකිය. බ්‍රෝම්ලි (Bromley) විසින් 1989 දී ඉඩම් අයිතිය පිළිබඳව සංකල්ප 04 ක් හඳුන්වා දී ඇත. එනම් පොදු දේපල අයිතිය, පෞද්ගලික අයිතිය, විවෘත අයිතිය සහ රාජ්‍ය අයිතිය වශයෙනි. මෙම ඉඩම් අයිතිය මෙරටට පොදු බව ශ්‍රී ලාංකේය අතීතය, වර්තමානය පරීක්ෂාකර බැලීමේ දී පැහැදිළි වේ.

ඉඩම් 'අයිතිය' සහ 'භුක්තිය' යනුවෙන් අදහස් කරන්නේ එකම තේරුම ඇති වචන දෙකක් නොව අර්ථ නිරූපණ දෙකක් සහිත වූවකි. 'අයිතිය' යනු නීත්‍යානුකූලව යම් පුද්ගලයෙකුට ලැබෙන හිමිකමකි. නමුත් භුක්තියේ දී අයිතියක් නොමැතිව වුව ද භුක්ති විඳිය හැකි ය. එය ගිවිස ගන්නා ආකාරය අනුව වෙනස් වේ. ශ්‍රී ලංකාවේ ඉඩම් අයිතිය රෝම ලන්දේසි නීතියේ සඳහන් වන ආකාරයට අර්ථ දක්වා ඇත. පසුකාලීනව එය වරින් වර ව්‍යවස්ථාදායක සභාවේ සහ පාර්ලිමේන්තුවේ නීතිගත කෙටුම්පත් මඟින් සංශෝධනය වී ඇත. 'අයිතිය' (Ownership) යන්නෙහි සරල

අර්ථය වන්නේ මිලදී ගැනීම හෝ ප්‍රදානයක් මඟින් හෝ ඉඩමක් අතින් අත මාරු වූ විට එම ඉඩම පිළිබඳ සියලුම නෛතික අයිතීන් මිලයට ගනු ලැබූ හෝ ප්‍රදානය ලබා ගත් පාර්ශවයට හිමි වේ. විවිධ නීති කෙටුම්පත් මගින් ඇතැම් ඉඩම් පවරා ගැනීමකට රජයට අයිතිය තිබුණු බව ශ්‍රී ලංකාවේ ඉඩම්වලින් 80% ක් පමණ රජයට අයත් වීමෙන් පැහැදිලි වේ (Report of the Land Commission, 1987).
මීට අමතරව දේපල හිමිකම (Property rights) යන්නෙන් අදහස් කරනුයේ ආර්ථිකයක සම්පත් භාවිතයේදී එම සම්පත් හා පුද්ගලයන් අතර පැවතිය යුතු සම්බන්ධතාවය අර්ථ දක්වන නීතිරීති, සම්ප්‍රදායන්, සමාජ පිළිගැනීම් සහ ව්‍යාපාකම්වලින් සමන්විත සංකීර්ණ ප්‍රපංචයකි (අබේගුණවර්ධන, සේනාරත්න, 2002: 109). වර්තමාන සමාජයේ දේපල අයිතිය ප්‍රධාන වශයෙන් නීතිමය ක්‍රියාදාමයක් මඟින් ක්‍රියාවට නැගෙයි. මෙහිදී විවිධ සම්පත් භාවිතය සම්බන්ධයෙන් පුද්ගලයන් හෝ පුද්ගල කණ්ඩායම් සතුවන අයිතිවාසිකම්, වරප්‍රසාද මෙන්ම එම අයිතිවාසිකම්වල සීමාවන් ද එම සීමාවන් උල්ලංඝනය කිරීමට එරෙහිව පැනවෙන දඬුවම් ද අර්ථ දැක්වෙයි.

ආර්ථික විද්‍යාඥයන්ට අනුව වෙළඳපොළ කාර්යක්ෂමතාවය පවත්වා ගැනීම සඳහා දේපල හිමිකම්වල පහත සඳහන් ප්‍රධාන ගුණාංග 4 ක් තිබිය යුතු විය. ඒවා නම් භුක්ති විඳීම සඳහා පැහැදිලි අයිතිය (Right to use), අයිතිවාසිකම් නිරවුල්ව අර්ථ දක්වා තිබීම (Correct justification of right), පවරා දීමේ හැකියාව තිබීම (Transferability) සහ හිමිකමේ ඇති වලංගුතාවය තහවුරු කර තිබීම (Enforceability) ආදියයි (සේනාරත්න, 2002: 110).

පුරාණ සහ මධ්‍ය කාලීන ලංකාවේ ඉඩම් අයිතිය සහ භුක්තිය මීට වඩා බෙහෙවින්ම වෙනස් විය. බොහෝ විද්වතුන් සඳහන් කරන අන්දමට අතීතයේදී රජතුමා රාජ්‍යයේ සියලු ඉඩම්වල හිමිකරු විය (කොඩ්රිංටන්, 1980: 5/6; ආරියපාල, 1956: 140; ගයිගර්, 1960: 50; අබේසිංහ, 1966: 101). මේ පිළිබඳව තවදුරටත් විග්‍රහ කිරීමේදී රජතුමා භූපති, පෘථිවියේ ස්වාමියා හෙවත් මහිපති, භූපාල පෘථිවියේ ආරක්ෂකයා වූ අතර සියලු දෙනාගේ, ක්ෂේත්‍රයන්ගේ අධිපති වූ බවද සඳහන් කරනු ලබයි (ආරිය අභයසිංහ, 1978 :32). මේ අයුරින් භූමිය සම්බන්ධ පරම අයිතිය රජු සතු වී ඇති අතර ඉඩම් ලබා දීමේ මූලිකයා වූයේ ද රජු ය. මෙලෙස රජුට අයිති ඉඩම්වලින් කොටසක් රජ පවුලේ අය සඳහා ද වෙන්කර තිබිණි. මෙම ඉඩම් 'ගබඩා ගම්' ලෙස හඳුන්වයි. රජ බිසවට/රැජිනට අයත් වූ ගම් 'බිසෝගම්' විය. ඊට අමතරව රජුගේ ප්‍රධාන භාණ්ඩාගාරය එනම් 'මහවාසල ගබඩාව' හැරුණවිට ඔහුගේ පෞද්ගලික භාණ්ඩාගාරය, (උඩ ගබඩාව) බිසෝවරුන්ගේ හා කුමාරවරුන්ගේ භාණ්ඩාගාරය (පල්ලේ වාහල ගබඩාව) ද වශයෙන් දක්නට ලැබිණි (පිරිස්, 1964: 49). මීට අමතරව 'විදානෙ ගම්' වශයෙන් ද ඉඩම් කොටසක් වෙන් වී තිබිණි. මෙම ඉඩම් රජයේ දීන සේවාවන්හි නියුතුව සිටි පහත් කුලවල මිනිසුන් වාසය කළ ගබඩා ගම් විශේෂයකි (පිරිස්, 1964: 56). පූජනීය ස්ථාන හා පැවිද්දන්ගේ යැපීම සඳහා ද සමහර ගම්බිම් වෙන් කරන ලදි. ඒවා 'විහාර ගම්' හා 'දේවාල ගම්' වශයෙන් හැඳින්විණි. මීට අමතරව රජුට සේවය කළ නිලධාරීන්ගේ යැපීම සඳහා

ද එම සේවයට අනුග්‍රහයක් වශයෙන් හා වේතනයක් වශයෙන් ද ගම් බිම් ප්‍රදානය කිරීමක් සිදු විය.

මේ ආකාරයට යම්කිසි පුද්ගලයෙකුට ඉඩම්වල අයිතිය ලැබුණේ ඒ සඳහා ඉටු කළ යුතු අනිවාර්ය රාජකාරි සේවාව මතය. මේ සේවය හෙවත් රාජකාරිය වාර්ෂික 'බුං ඔප්පු කිරීමේ' (බුලත් හුරුල්ලක් පිදීමේ) චාරිත්‍රානුකූල සේවයේ සිට කුඹුරු කෙටීම හා බර රැගෙන යාම වැනි ඉතා දුෂ්කර ශ්‍රමික කටයුතු දක්වා විවිධ විය. රාජකාරි සේවාව හේතුකොටගෙන, ඉඩකඩම් අරභයා වූ ප්‍රවේණි අයිතිය, විශිෂ්ටත්වයට හිමිකම ලැබෙන්නා වූද, පුද්ගලයෙකුට නීත්‍යානුකූලව ලබාගත හැකි වූද උසස්ම දේපළ හිමිකමකි. එහෙත් අවස්ථා කීපයකදී හැරෙන්නට මේ ඉඩම් සඳහා ද පෞද්ගලික සේවාවන් හෝ මුදලින් නැතහොත් ද්‍රව්‍යවලින් ගෙවීමක් හෝ කළ යුතු විය. මෙය රාජකාරිය ලෙස හැඳින්විණි (පිරිස්, 1964: 46). මෙහිදී රාජකාරිය සම්බන්ධ වී තිබුණේ පුද්ගලයාට නොව ඉඩමට වන අතර රාජකාරිය ඉටු නොකළ විට ඉඩම පුරප්පාඩු විය. අලුතින් අයිතිවාසිකම් කියන්නා ඒ ඉඩම සඳහා රාජකාරි ඉටුකළ යුතු ය. එමෙන්ම විකිණීමේ දී හෝ තෑගි දීමේදීත් එය මිළදී ගන්නා හෝ ලබන්නා රාජකාරිය ඉටු කළ යුතු ය. මේ අනුව පුරාණ ශ්‍රී ලංකාවේ ඉඩම් අයිතිය පවරනු ලැබුවේ රාජකාරිය ඉටු කරනු ලබූ පුද්ගලයාට ය.

නිලයට අයත් ප්‍රසාදයක් වශයෙන් ඉඩම් ලැබුවේ නම් ඒවා 'නින්දගම්' වශයෙන් හඳුන්වනු ලබයි. උසස් තනතුරු සඳහා ලබාදුන් ඉඩම් 'සේවා පරවේණි ඉඩම්' ප්‍රදාන නම් වේ. ඒවායේ අයිතිය පරපුරෙන් පරපුරට අයත් වේ. මේ අනුව 'ආණ්ඩුවේ සිවිල් අධිකරණ පාලනය ද කෘෂිකාර්මික සංවර්ධන කටයුතු, ආරක්ෂක කටයුතු, යුධ කටයුතු ද යන මේවා සියල්ලම ඉටු කරන යන්ත්‍රය වූයේ උසස්ම තරාතිරම දක්වා වූ සෑම පන්තියක්ම හා සෑම පුද්ගලයෙකුම ඇදෙන සේ සකසා තිබුණු යුතුකම් හා සේවා දාමයයි' (බර්ටොලැස, 1817: 299).

රජුගේ අයිතිය යටතේ ක්‍රියාත්මක වූ ඉඩම් භුක්තිය තරමක් දුරට වෙනස් වීමක් දක්නට ලැබේ. පෘතුගීසි පාලන සමයේ දී (1505-1658) කෝට්ටේ රාජ්‍යයේ බලය අල්ලා ගැනීමෙන් පසුව ඉඩම් සම්බන්ධ විවිධ ක්‍රියාමාර්ග ගෙන ඇත. ඔවුන්ගේ ප්‍රතිපත්තිවල මූලික හරය වූයේ දේශපාලනික වශයෙන් බලය ලබා ගැනීමට ඉඩම් ප්‍රතිපත්තිය භාවිත කළ යුතු බවයි. දේශපාලන බලය ලබා ගැනීමේ අරමුණින් ඉඩම් සම්බන්ධ ප්‍රතිපත්ති, තීන්දු ගනු ලැබූ පෘතුගීසිහු 1615 දී නිර්මාණය කරන ලද තෝම්බුව අනුව මේ රටේ වැඩි ඉඩම් ප්‍රමාණයක හිමිකරුවෝ බවට පත් වූහ (Abeysinghe, 1978: 67). මේ අනුව 16 වන සියවස ආරම්භ වන විට කෝට්ටේ රාජ්‍යයේ තිබූ ගබඩාගම්වලින් වැඩි කොටසක් පෘතුගීසීන්ට අයත් විය. මේවා අනිවාර්ය සේවාවෙන් බැහැර වූ පෞද්ගලික ඉඩම් අයිතිය බවට පත් විය. එහිදී අනිවාර්ය සේවාව වෙනුවට බිම් බද්දක් අය කරන ලදී.

ලන්දේසි පාලන කාලයේ දී ඉඩම් අයිතිය පෙර පැවති සිරිත් විරිත් කුල සම්ප්‍රදායන් පිළිබඳ නොසළකමින් ඔවුන්ගේ දේශපාලන, ආර්ථික ව්‍යාපාරයන්ට ගැලපෙන සේ

සකස් කර ගන්නේය. ඔවුහු ඉඩම් බෙදා දීම සිදු කළ අතර රජයට ගෙවන දීමනාව හා සේවාව වෙනුවට බද්දක් අයකර ගත්හ . මේ කාලයේදී තෝම්බුව ක්‍රියාත්මක විය. මෙහිදී ගෘහ මූලිකයාට ඉඩම් අයිතිවන ලෙසත් ගොඩමඩ ලෙස වෙන් වූ ඉඩම් ලෙසත් වෙන්කර සඳහන් කර තිබිණි. ඉඩමේ ප්‍රමාණය කොස්, පොල්, පුවක්, වගාවන් ආශ්‍රයෙන් සඳහන් කරන ලද අතර හිස් ඉඩම්වල වපසරිය වැවිය හැකි ගස් ප්‍රමාණයෙන් දක්වා තිබිණි. ඒ වගේම වතු හා පොල් සඳහා අයබදු වෙනවෙනම සඳහන් කර තිබිණි. කුඹුරු ඉඩම්, අමුණු, කුරුණි වශයෙන්ද, ඕවිට, රත්නින්ද, මළපාළුව, නිලපාලු, රත්මහර, යනාදි විවිධ කාණ්ඩයන් යටතේ ද නම් කර ඇත. වගා කරන ක්‍රමය අනුව අඳ, බදු, හෝ වෙනත් භුක්ති ක්‍රමයක්ද යන්න පැහැදිලිව සඳහන් කර තිබිණි. තවත් විශේෂ දෙයක් වන්නේ තෝම්බුවේ, ඉඩම් අයිතිය, පරවේනි අයිතියක් ද, මිලදී ගැනීමක් ද, වගා කරන ලද රජයේ ඉඩමක් ද යන්න පැහැදිලිව සඳහන් කර තිබීමයි.

බ්‍රිතාන්‍ය පාලන ක්‍රමය තුළ ඉඩම් භාවිතය සිදු කරන ලද්දේ ධනේෂ්වර ක්‍රමයට ගැලපෙන ආකාරයකටය. ඉඩම් භුක්තිය සම්බන්ධයෙන් ගනු ලැබූ මූලික ක්‍රියාමාර්ගය වූයේ 1832 දී කෝල්බෲක් ප්‍රතිසංස්කරණ මඟින් රාජකාරි ක්‍රමය අහෝසි කිරීමයි. එමඟින් මෙතෙක් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වූ වැඩවසම් නීතිරීති අහෝසි විය. එමෙන්ම ඉඩම් හා මිනිසා අතර තිබූ බැඳීම් ද ලිහිල් වන්නට විය. ඒ වගේම ඉඩම් වෙළඳපොලේ නිෂ්පාදිත සාධකයක් බවට පත් විය. බ්‍රිතාන්‍ය ඉඩම් ප්‍රතිපත්තියේ වැදගත් අවස්ථාවක් ලෙස 1840 අංක 05 සහ අංක 12 දරණ කිරීට ඉඩම් ආඥා පනත (Crown Land Ordinance of 1840) සඳහන් කළ හැකිය. ජයවර්ධන සඳහන් කරන අන්දමට "එසේ නොවේ යැයි ඔප්පු කරන තෙක් සියලු කැලෑ ඉඩම්, භාවිතයට නොගත් ඉඩම්, කිරීටයට අයත් ඉඩම් ලෙස සළකනු ලැබේ." වගා කළ හැකි හේන් ඇතුළු අනෙකුත් ඉඩම් රජයට අයිති ඉඩම් ලෙස සළකනු ලැබේ (ජයවර්ධන, 1990: 8) මේ අනුව ඉඩම් අයිතිය ඔප්පු කර ගත නොහැකි නම් එවක විජිත රාජ්‍ය සතු වන බවට ඒවා පත්විය. මේ නිසා පාරම්පරික ඉඩම් භුක්තිය ගැමියන්ට අහිමි විය.

1856 අංක 10 දරණ පන්සල් ඉඩම් ආඥා පනත (Temple Land Ordinance of 1856) මඟින් තවදුරටත් ගැමියන්ගේ හා ඉඩම් අයිතිය සීමා සහිත විය. මෙමගින් පන්සල් සතු භූමිය මැන ලේඛනයක් සකස් කර ඇත. ඒ සඳහා වියදම් කළ වියදම ගෙවීමට නොහැකි වුයේ නම් පන්සල් සතුව තිබූ ඉඩම් බ්‍රිතාන්‍ය රජය සතු විය.

ධාන්‍ය බදු ආඥා පනත (Grain Tax Ordinance of 1872) හඳුන්වා දීම මඟින්ද තවදුරටත් ඉඩම් අයිතිය සීමා සහිත කරන ලදි. මේ යටතේ ඉඩම්වලින් රජයට බද්දක් ගෙවීමට නියමිත විය. එය නොගෙවන ගොවීන්ගේ ඉඩම් බ්‍රිතාන්‍ය සතු විය. බ්‍රිතාන්‍ය ඉඩම් ප්‍රතිපත්තියේ මීළඟ අවස්ථාව වශයෙන් 1897 අංක 01 දරණ මුඩු බිම් පනත (Waste Land Ordinance No. 108 ,1897) හඳුන්වා දිය හැකි ය. මෙම පනතේ 24 වන ඡේදයේ සඳහන් කර ඇති පරිදි පුද්ගලයෙකුගේ පදිංචිව සිටින භූමිය හැර ඔවුන්ට අයත් යැයි කියා ගන්නා අනෙක් බිම් ප්‍රදේශ ඔහුට නොව

රජයට අයිති බව සලකනු ලැබේ. මෙමගින් මෙතෙක් ගොවියන් සතු වූ ඉඩම් තව දුරටත් රජයට අයත් කරගන්නා ලදී.

මෙම ආඥා පනත් අනුව පාරම්පරික ඉඩම් භුක්ති ක්‍රම අහෝසිව ගිය අතර දේශීය හා විදේශීය ධනපති පන්තියට ඉඩම් රාශියක් හිමිවිය. මෙම යටත් විජිත ඉඩම් ප්‍රතිපත්තියේ භයානක ප්‍රතිඵලයක් ලෙස ඉඩම් අහිමිකම, ග්‍රාමීය ප්‍රදේශවල බරපතල ලෙස මතුවී තිබිණි. එනිසාම ශ්‍රීමත් හියුක්ලිෆඩ් වැනි බ්‍රිතාන්‍ය පාලකයන් ද ඞී. ඒ. බ්‍රේත් වැනි දුර දක්නා නුවණැති සිවිල් සේවකයන්ද විසින් ගොවීන් ආරක්ෂා කළ යුතුයැයි අදහස් මතු කරන ලදී. 1927 දී ඉඩම් කොමිෂම ඇති වීමට මුල් වන ලද්දේ මෙම අදහස් ය. මෙම කොමිෂම මඟින් පනත් දෙකක් සැකසිණ. 1931 දී ඉඩම් නිරවුල් කිරීමේ ආඥාපනත හඳුන්වා දුන් අතර එහිදී ඉඩම් අහිමි වූ පුද්ගලයන්ට තම අයිතිය ඉදිරිපත් කර සහන ලබා ගත හැකි විය. ඊට අමතරව 1935 දී ඉඩම් සංවර්ධන ආඥා පනත ඇති (Land Development Ordinance of 1935) කර රජයට අයිති ඉඩම් ක්‍රමානුකූලව යළි බෙදා හැරීමේ ක්‍රියාමාර්ගය ආරම්භ කරන ලදී. මෙම ඉඩම් පිළිගත් ප්‍රමාණයකට වඩා ඉඩම් ඒකක කුඩා වීම වැලැක්වීම සඳහා ආරක්ෂිත පියවරයන් ද ගෙන තිබිණි. එහිදී බෙදා දෙන ලද ඉඩම් සඳහා එක් හිමිකරුවෙක් පමණක් සිටීමේ ක්‍රමය ද හඳුන්වා දී ඇත. වර්තමානයේදී පවා ඉඩම් අහිමි වූ ගොවීන් සඳහා ඉඩම් බෙදා හරිනු ලබන්නේ මෙම පනත යටතේ ය. මෙසේ ඉඩම් බෙදා හරිනු ලැබුව ද ග්‍රාමීය හා පෞද්ගලික අංශවල ඉඩම් කැබලිවල අයිතියේ හා භුක්තියේ ඇති වී තිබෙනුයේ අවිනිශ්චිත තත්වයකි.

1958 කුඹුරු පනත (Paddy Land Act of 1958) යටතේ අඳයට වගා කරන ගොවීන්ගේ ආරක්ෂාව සහතික කරන ලද අතර අඳ උරුමය පවරා දීමද හඳුන්වා දෙන ලදී. මේ පනත යටතේ සමාජයේ යහපත සඳහා භූමිය භාවිත කිරීමේ අයිතිය හඳුන්වා දෙනා ලදී. 1970 වන විට සිදු වූ ඉඩම් බෙදා හැරීම හා රජයේ සහයෝගය ලැබූ ජනතාවාස ක්‍රමයක් යටතේ ඉඩම් සංවර්ධනය වෙනුවට 1972 -1975 දී ඉඩම් ප්‍රතිසංස්කරණ නීතිය අනුව තේ, පොල්, රබර් වතු විශාල ප්‍රමාණයක් ජනසතු කිරීමත්, රජයට පවරා ගැනීමත් සිදු කෙරුණි. එවගේම පෞද්ගලික ඉඩම් අයිතියද සීමා කෙරුණි. යළිත් වරක් 1977 දී මෙම ඉඩම් ප්‍රතිසංස්කරණ නීතිය නවතා දමන ලද අතර වාරිමාර්ග හා ඉඩම් ජනාවාස ක්‍රමයන්ට අවධානය යොමු කරන ලදී. මේ යටතේ විශාල, මධ්‍යම හා කුඩා පරිමාණ වාරි මාර්ග හා ඉඩම් සංවර්ධන ව්‍යාපෘතීන් අඩංගු කරන ලදී. 1979 වන විට ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යංශයට අනුබද්ධව ඉඩම් භාවිත කිරීමේ ප්‍රතිපත්ති සැකසුම් අංශය පිහිටුවනු ලැබීය. මෙමගින් ග්‍රාමීය ආර්ථිකය සංවර්ධනය කිරීම අරමුණ කර වඩා තාර්කික ඉඩම් සම්පත් භාවිතයට අදාළ වැදගත් ප්‍රතිපත්ති වාර්තාවක් ගන්නා ලදී.

ඉහත සඳහන් ආකාරයට ශ්‍රී ලංකාවේ ඉඩම් අයිතිය වෙනස් වී ඇත. පසු කාලීනව ස්වර්ණභූමි රත්න භූමි හා ජයභූමි, බිම් සවිය වැනි ඉඩම් භුක්තිය සනාථ කරනු ලබන ඔප්පු පිරි නැමීම සිදු කරන ලදී. මෙම වෙනස් වීම් සෑම අවස්ථාවකම පොදු ජනතාවගේ ඉඩම් භුක්තිය සාධාරණීකරණය කිරීමටත්, ඔවුන්ට වඩාත් හොඳ ජීවන

මාර්ගයක් උදා කිරීමටත් යන අරමුණ ඇතිව සිදු කර තිබිණි. වර්තමානය වන විට මෙම ඉඩම් භුක්ති ක්‍රම හා දුගී පන්තිවලද වෙනස්කම් දක්නට ලැබේ. මෙවැනි සංකල්පීය ප්‍රස්තුතයන් සහ ව්‍යවහාරික තත්වයන් පිළිබඳව විධිමත්ව අධ්‍යයනය කිරීම කාලීන අවශ්‍යතාවයක් ලෙස හැගේ.

## අධ්‍යයන ගැටළුව

ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාව මිලියන 20. 5 කි. භූමි ප්‍රමාණය ගත් විට අක්කර මිලියන 16 කි. ඊට සාපෙක්ෂව මිනිස් බිම් අනුපාතිකය (Man Land Ratio) ක්‍රමයෙන් ශීඝ්‍රයෙන් පහත වැටී ඇත. 1830 දී හෙක්ටයාර් 6. 83 වන මිනිස් බිම් අනුපාතිකය 2001 වන විට හෙක්ටයාර් 0.31 දක්වා අඩුවී ඇත. ඒ සඳහා බලපා ඇති අනෙක් සාධකය වන්නේ රටේ මුළු භූමි ප්‍රමාණයෙන් 82.34% ක් යම් ආකාරයකින් තවමත් රාජ්‍යය පාලනය යටතේ පැවතීමයි. මෙම තත්වයන් නිර්මාණය වීම සඳහා යටත් විජිත යුගයේ පැවති ඉඩම් ප්‍රතිපත්තීන් හා 1972 -1975 කාලය තුළ සිදු කරන ලද ඉඩම් ප්‍රතිපත්තීන්ද හේතු වී ඇත. .

ඉඩම් පරිහරණය පිළිබඳ නීති රීති පනවා තිබියදීත් ව්‍යවහාරික වශයෙන් එම රාමුවෙන් පිටත මිනිසුන් ක්‍රියා කරනුයේ මන්ද යන්න සොයා බැලිය යුත්තකි. එසේ කිරීම නිසා සිදු විය හැකි පෞද්ගලික හා පොදුවේ රටට බලපාන සාධක සොයා බැලිය යුතු ය. ඊට අමතරව එමගින් පැන නැගුන ඉඩම් කළමනාකරණය සම්බන්ධ ගැටළු, හිඟ සම්පත් භුක්ති විඳීමේ ගැටළු, අස්වැන්න අඩුවීම හා ඒ පිළිබඳ කටයුතු සහ ගොවි සංවිධානවල ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් පැන නගින ගැටළු පිළිබඳව ද අවධානය යොමු කළ යුතුව පවතී.

කෘෂිකාර්මික බිම් ප්‍රමාණය අඩුවීම කෘෂි නිෂ්පාදනයට බලපෑමක් එල්ල කරයි. පවත්නා භූමි පරිභෝජනය ක්‍රමානුකූලව (systematic), උපරිම ඵලදායිතාවයක් (Optimum productivity) සහ තිරසාර (Sustianable) අයුරින් යොදාගෙන තිබේ ද යන්න මෙම අධ්‍යයනයේදී මතුවන ප්‍රධාන අධ්‍යයන ගැටළුව වේ. එසේම එම ඉඩම්වල අයිතිය සහ භුක්තිය එකී භාවිතය සඳහා කෙබඳු බලපෑමක් සිදුකෙරේද යන්න ඒ හා බැඳුණු අනෙක් අධ්‍යයන ගැටළුව වේ.

## අධ්‍යයනයේ අරමුණු

ඉඩම් අයිතිය සම්බන්ධයෙන් පවතින ගැටළුවක් වන්නේ ශ්‍රී ලංකාව තවමත් යටත් විජිත ඉඩම් ප්‍රතිපත්තියේ හානිකර බලපෑම්වලින් මිදීමට හැකියාවක් ලැබී නොමැති වීම ය. ශ්‍රී ලංකාවේ සමස්ත ඉඩම් ප්‍රමාණයෙන් 40%ක් පමණ සංවර්ධනය කළ හැකි මට්ටමක පවතී. නමුත් මේවා පවතින්නේ වියළි කලාපයේ ය. එනිසා ඒ ඉඩම් සංවර්ධනය සඳහා නවීන වුත්, ආකර්ෂණීය වූත් සංවර්ධන උපාය මාර්ගයක් අවශ්‍යවේ. එමෙන්ම මුළු රටේම අනාගත පරම්පරාවන් අතට පත්විය යුතු ඉඩම් වැනි ජාතික සම්පතක් නාස්ති කිරීම කළ නොහැකි නිසා ම සංවර්ධනය කළ හැකි

ඉඩම් ඉතාම කාර්යක්ෂම ආකාරයෙන් භාවිත කළ යුතු ය. ජාතික සුභ සිද්ධිය සඳහා මේ ප්‍රදේශවල පදිංචිකරුවන්ට පමණක් නොව සමස්ත ජනතාවටම ලැබෙන පරිදි එය කළ යුතු ය. ඒ සඳහා එම භූමියේ ඇති ගැටළු හඳුනා ගත යුතු ය.

වර්තමානයේ මිනිසා මුහුණ දෙන ප්‍රධාන ගැටළුවක් වන්නේ ඉඩම් අයිතිය වෙනස්වීම පිළිබඳ ගැටළුවකි. ඉඩම් අයිතිය, ඉඩම් භුක්තිය යන සීමාවන් ඉඩමක කාර්යක්ෂම භාවිතය සඳහා අත්‍යවශ්‍ය වන නිසා මෙම පර්යේෂණය මඟින් පහත සඳහන් අරමුණු කෙරෙහි අවධානය යොමුකොට ඇත.

1. ඉඩම් අයිතිය සහ භුක්තිය කෙතෙක් දුරට කෘෂිකාර්මික ඉඩම් පරිහරණය කෙරෙහි බලපා තිබේදැයි සොයා බැලීම.

2. කෘෂි කාර්මික භූමි පරිහරණයේදී පවත්නා අයිතිය හා භුක්තිය මත පදනම් වී ඇති ගැටළු හඳුනා ගැනීම සහ ඒවා අවම කිරීමේ යෝජනා ඉදිරිපත් කිරීම.

**අධ්‍යයන ක්‍රමවේදය**

මෙම අධ්‍යයනය සඳහා අධ්‍යයන ප්‍රදේශය වශයෙන් මහවැලි H කලාපය තෝරාගනු ලැබේ. නව වාරිමාර්ග ජනපදයක් වන එම ජනපදයේ නව පදිංචි කාරුවන් මෙන් ම පැරණි ජනපදකරුවෝද පදිංචිව සිටිති. ඒ අනුව පැරණි පදිංචි කරුවන්, නව ජනපදිකයන් සහ ඔවුන්ගේ දෙවන හා තෙවන පරම්පරාවලට අයත් ජනතාවගේ ඉඩම් අයිතියේ සහ භුක්තියේ පැහැදිළි වෙනස්කම් රාශියක් පැවතීම හේතුකොටගෙන මහවැලි H කලාපය මෙම අධ්‍යයනය සඳහා තෝරාගනු ලැබිණි. මෙම කලාපය තුළ ජනපදිකයන් පදිංචි වීමේදී විවිධත්වයක් දක්නට ලැබේ. එනම් මහවැලි අධිකාරිය විසින් බෙදා දෙනු ලැබූ ඉඩම් ලාභීන්, අනවසර පදිංචිකරුවන්, ඉඩම් මිලදී ගැනීම්, ඉඩම් බදු වශයෙන් ලබා ගැනීම්, උකස් කිරීම් වශයෙන් ලබා ගත්, පැරණි පදිංචිකරුවන් සහ විවිධ පැවරීම් යටතේ ලබාගත් ඉඩම් හිමිකම් වශයෙනි.

H කලාපයේ ජනගහනය 2009 වර්ෂය වන විට දළ වශයෙන් 1, 84000 ක් පමණ වේ. මෙයිනුත් ඉඩම් අයිතිය සහ භුක්තිය ආශ්‍රිත ගැටළු රාශියක් පවතින්නේ මහවැලි H කලාපයෙත්, ගල්නෑව උප කලාපයේය. ඒ අනුව ගල්නෑව උප කලාපය මෙම අධ්‍යයනය සඳහා තෝරා ගැනේ.

අධ්‍යයන ප්‍රදේශයේ පිහිටීම




මූලාශ්‍රයඃ තොරතුරු අනුව GIS භාවිතයෙන් නිර්මාණය කර ඇත.

ගල්නෑව ඒකකය තුළ උප ඒකක 04 ක් දක්නට ලැබෙන අතර අවුකන, බුල්නෑව, කලංකුට්ටිය, හුරීගස්වැව ලෙස ඒවා නම් කළ හැකිය. ඒ අතරිනුත් අනවසර පදිංචි කරුවන් වැඩි ප්‍රමාණයක් සිටින බුල්නෑව ඒකකය මෙම අධ්‍යයනය සඳහා තෝරා ගනු ලැබේ. බුල්නෑව ඒකකයේ හෙක්ටයාර් 1184ක් ගොඩ ඉඩම්, නිවාස ඉඩම් 116ක් වානිජ ඉඩම් 179ක් ව්‍යාපාරික ඉඩම් 03ක් වාරි ඉඩම් 889ක් සහ නොමනින ලද ඉඩම් 54ක් වශයෙන් දක්නට ලැබේ. එයින් වාරි ඉඩම් හැර අනෙක් සියල්ලෙහි එකතුව ඉඩම් 1536කි. එයින් 7% ක් නියෝජනය වන ආකාරයට සසම්භාවී නියදි ක්‍රමය (Random sample) භාවිතා කර ප්‍රශ්නාවලියක් භාවිතා කර තොරතුරු ඒකරාශි කෙරිණි. වගු අංක 1 තුලින් මෙය තහවුරු කර ඇත.

ගොවිජනපද ව්‍යාපාරවල ඉඩම් අයිතිය අවිධිමත් අයුරින් වෙනස් වීම පිළිබඳ අධ්‍යයනය කිරීම සඳහා ප්‍රාථමික හා ද්විතීක දත්ත යොදා ගනු ලැබේ. ප්‍රාථමික දත්ත රැස් කිරීමේදී තෝරාගත් නියදියකට අදාළව ප්‍රශ්නාවලියක් භාවිත කිරීමෙන් තොරතුරු ලබා ගැනේ. මීට අමතරව ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදයක් වන නිරීක්ෂණය සහ තෝරාගත් පුද්ගලයින් සමඟ සාකච්ඡා පැවැත්වීම ද සිදු කෙරිණ. ග්‍රාමීය බැංකු, එළදා වර්ධන කමිටු, ගොවිකාරක සභා, නිලධාරින්, කෘෂිකර්ම නිලධාරීන්, සංවර්ධන නිලධාරීන් සමග පවත්වනු ලැබූ සාකච්ඡාද ප්‍රයෝජනවත් විය.

ද්විතීය දත්ත ලබා ගැනීමේ දී මහවැලි H කලාපයේ පරිපාලන ඒකක, වෙනත් ගොවිජනපද ව්‍යාපාර පරිපාලන ඒකක එක් රැස්කර ඇති වාර්තා, මේ සම්බන්ධ සිදු කළ පර්යේෂණ ග්‍රන්ථ, මේ හා සම්බන්ධ ලියවී ඇති කෘති, සඟරා, ලිපි, ලේඛන සහ අන්තර්ජාල පහසුකම් පරිශීලනය කොට ඇත.

තිරසර අයුරින් භූමි භාවිතය කෙරෙහි ඉඩම් අයිතියේ සහ භුක්තියේ බලපෑම කෙතෙක් දුරට තීරක සාධකයක් වී තිබේ ද යන්න තීරණය කිරීම පිණිස විස්තරාත්මක ක්‍රමවේදය (Descriptive method) මෙන්ම විශ්ලේෂණාත්මක ක්‍රමවේදයද (Analytical method) භාවිත කෙරේ. විශේෂයෙන්ම විශ්ලේෂණාත්මක ක්‍රමවේදයන් යටතේ ප්‍රධාන සංරචකයන්ගේ හැසිරීම අවබෝධකර ගැනීම සඳහා කේන්ද්‍රික ප්‍රවණතා මිනුම් සහ අපකිරණ මිනුම් යොදා ගැනේ. එමෙන්ම තෝරාගත් සංරචක අතර හැසිරීම අවබෝධකර ගැනීමටත්, ඒවා විශ්ලේෂණය කිරීමටත් ප්‍රතිපායන විශ්ලේෂණය වැනි සංඛ්‍යාන විද්‍යාත්මක උපාය මාර්ග භාවිතා කොට ඇත. විශේෂයෙන්ම ගෙවතු වගාවේ ඝනත්වය (density) හඳුනා ගැනීම සඳහා වර්ග මීටර් 1 ($m^2$) ක භූමි ඒකකයක් මත පවතින බෝග වර්ග ගණනය කොට 'ගෙවතු වගාවේ සූක්ෂමතාවය'(intensity in homegarden) ගණනය කොට ඇත.

## සාකච්ඡා සහ සමාලෝචන

නව වාරිමාර්ග ජනපදයක් වන මෙම ජනපදයේ නව පදිංචි කරුවන් මෙන්ම පැරණි ජනපදකරුවෝ ද පදිංචිව සිටිති. ඒ අනුව පැරණි පදිංචි කරුවන්, නව ජනපදිකයන් සහ ඔවුන්ගේ දෙවන හා තෙවන පරම්පරාවලට අයත් ජනතාවගේ ඉඩම් අයිතියේ සහ භුක්තියේ පැහැදිලි වෙනස්කම් රාශියක් දක්නට ලැබිණි.

මහවැලි සංවර්ධන ව්‍යාපාරය ආරම්භ කිරීමෙන් අනතුරුව ශ්‍රී ලංකාව තුළ කෘෂිකාර්මික සංවර්ධනයක් ශීඝ්‍ර වශයෙන් සිදුවෙතැයි අපේක්ෂා කරන ලදී. නමුත් කෙටි කාලයක් තුළ මෙම ව්‍යාපාරයේ යම් යම් අඩුපාඩු සහ ගැටලු නිර්මාණය වීමක් දක්නට ලැබිණි. එම ගැටළු අතර ප්‍රධාන ස්ථානයක් ගනු ලැබූයේ දෙවෙනි සහ තුන්වන පරම්පරාවන් සඳහා ඉඩම් සම්පාදනය කරගැනීම ගැටළුවයි. ඒ හේතු කොටගෙන සමාජ, ආර්ථික හා දේශපාලනික ගැටළු රාශියක් මතුවී තිබිණි. මහවැලි සංවර්ධන ව්‍යාපාරය යටතේ එක් ගොවියකු සඳහා ගොඩ ඉඩම් අක්කර 1/2 ක් ද මඩ ඉඩම් අක්කර 2 1/2 ක් ද ලබා දී තිබිණි. මෙම ඉඩම් පැවරීමේදී කොන්දේසි සහිතව ඉඩම් සංවර්ධනය කිරීම සඳහා බෙදා දෙන ලදී. එහිදී ඉඩම් කැබලි කිරීම සිදු කළ හැකිවන්නේ ගොඩ ඉඩමක් අක්කර 1/4 ට සහ මඩ ඉඩමක් අක්කර 1 1/2 කට ය. එහිදී ගොඩ ඉඩම කොටස් 2 ක කට බෙදිය හැකි වුව ද මඩ ඉඩම කොටස් කළ නොහැකි විය. නමුත් මෙම පර්යේෂණ තොරතුරු අනුව අනාවරණය වුයේ නිතීයට පටහැනි වූ වෙනත් ඉඩම් භුක්ති ක්‍රම පවතින බවත් එවා සෘජුවම කෘෂිකාර්මික ඉඩම් පරිහරණය කෙරෙහි බලපාන බවත් ය. එම තොරතුරු පහත සඳහන් ආකාරයට දැක්විය හැකිය.

මහවැලි කලාපයේ මුල්ම ගොවි ජනපදය ආරම්භ කරන ලද්දේ ගල්නෑව කලාපය තුළය. මෙම ප්‍රදේශය අධ්‍යයනයේ නියැදිය වශයෙන් භාවිත කළ අතර එම කලාපය තුළ අනවසර පදිංචිකරුවන් විශාල ප්‍රමාණයක් දක්නට ලැබේ. එහි ජන සංඛ්‍යාව පිළිබඳ අවධානය යොමු කිරීමේ දි මුළු ජන සංඛ්‍යාව 422 වන අතර එහි ස්ත්‍රී පුරුෂ ජන සංයුතිය ගත් විට ස්ත්‍රී ජන සංඛ්‍යා ප්‍රමාණය 54% ක් වන අතර පුරුෂ ජන සංඛ්‍යාව 46% ක් වේ. ඔවුන්ගෙන් සාක්ෂරතාවය නැති පුද්ගලයන් 5% පමණ වන ඉතාම අඩු පිරිසක් නියොජනය කළ අතර අනෙක් සියලුම ජනතාව ප්‍රාථමික ද්විතිය, තෘතීය අධ්‍යාපනය ලැබුවෝ වෙති. මීට අමතරව ප්‍රදේශයේ පදිංචිකරුවන්ගෙන් ඉඩම් සම්බන්ධව ඉදිරිපත් කොට ඇති නෛතික තත්වයන් සමඟ කටයුතු කිරීම සඳහා පවතින දැනුවත් භාවය පිළිබඳව ගත්විට පුද්ගලයන් 45%ක් පමණම වඩාත් පැහැදිලි අවබෝධයකින් යුක්ත බව පෙනේ. එහිදි පැහැදිලි වන්නේ ඉහල සාක්ෂරතාවයක් පවතින බවකි.

අධ්‍යයන ප්‍රදේශයේ ජනතාවෙන් 38% ක් කෘෂිකාර්මික රැකියාවන්හි නිරත වන අතර 25%ක් වෙනත් රැකියාවන්හි නිරතවේ. තවත් 20%ක් පෞද්ගලික අංශයේ

රැකියාවන්හි නිරත වේ. ප්‍රදේශයේ ජනතාවගෙන් 10%ක් රජයේ රැකියාවන්හි නියුක්තව සිටින අතර 7% ක් වැනි පිරිසක් රැකියාව සමඟ ගොවිතැන කරයි.

පුද්ගලයන් ප්‍රකාශකරන පරිදි ඉඩම් අයිතිය සම්බන්ධ ගැටලු ඇති පිරිස 50%කි. එසේ නැතැයි ප්‍රකාශ කරන පිරිස 43%කි. කිසිසේත්ම ගැටලු නැත යනුවෙන් ප්‍රකාශ කරන පිරිස 7%කි. එහිදි 50%ක් දෙනාට ඉඩම් සම්බන්ධ ගැටලුකාරී බවක් නිර්මාණය වී තිබිණි. එම ගැටලුවල ස්වරූපය ගත් විට ඉඩම් විකිණිය නොහැකි වීම, ඉඩම්වලට නියම වටිනාකමක් නැති වීම, පැවරීම තුළ ගැටළු මතුවීම, ණය ගැනීමේ දී හෝ ඇප වශයෙන් තැබීමට නොහැකි වීම යන ගැටලු ප්‍රමුඛ වී තිබිණි.

ඉඩම් අයිතිය හා ඉඩම් පරිහරණය සම්බන්ධයෙන් ගත් විට තමන්ට අයිති ඉඩමක වගාකටයුතු කිරීමට කැමතියි යන මතය ප්‍රකාශකරන පුද්ගලයෝ 46%කි. එනම් අඩකට ආසන්න ප්‍රමාණයක් ඉඩම් අයිතිය, ඉඩම් පරිහරණය කෙරෙහි බලපාන බව මෙහිදි ප්‍රකාශ කරති. ප්‍රතිපායන රේඛාවට අනුව ඉඩම් අයිතිය සහ භූමි සංරක්ෂණය අතර ධන සම්බණ්ධතාවයක් පවතින බව පෙන්වාදිය හැකි ය. එනම් ඉඩම්වල අයිතිය තහවුරු වීම සමඟ භූමිය සංරක්ෂණය ප්‍රශස්ත ආකාරයට පවතින බව මෙයින් පිළිබිඹු කරයි. එහිදි තවදුරටත් පැහැදිලි කිරීමේදි සින්නක්කර ඉඩම් අයිතිය ඇතිවිට වඩාත් ප්‍රශස්ත භූමි සංරක්ෂණයක් ද අනවසර බද්ද, උකස් වැනි ඉඩම් භුක්තියක් පවතින විට වඩාත් අයහපත් භූමි සංරක්ෂණයක් ද දක්නට ලැබේ.

ප්‍රතිපායන විශ්ලේෂණට අනුව ඉඩම් අයිතිය සහ භූමි සංරක්ෂණය අතර ධන සම්න්ධතාවයක් පවතින බව පෙන්වාදිය හැකි ය. එනම් ඉඩම්වල අයිතිය තහවුරු වීම සමඟ භූමිය සංරක්ෂණය වැඩිවන බව පිළිබිඹු විය. එහිදි තවදුරටත් පැහැදිලි කිරීමේදි සින්නක්කර ඉඩම් අයිතිය ඇතිවිට වඩාත් ප්‍රශස්ත භූමි සංරක්ෂණයක් ද, අනවසර, අඳ වැනි ඉඩම් භුක්තියක් පවතින විට අයහපත් භූමි සංරක්ෂණයක් පවතින බව මෙම විශ්ලේශණයෙන් හෙළිදරව් වේ. සමස්ථයක් ලෙස සලකා බැලීමේදී පැහැදිලි වන්නේ t හා f යන පරික්ෂාවන් දෙක මගින්ද ඉඩම් අයිතිය හා භූමි සංරක්ෂණය අතර සමීප සම්බන්දතාවක් පවතින බව සනාත විය.

ඉඩම් භාවිතයේදි ප්‍රදේශයේ 52% පුද්ගලයින් භූමි සංරක්ෂණ ක්‍රම වශයෙන් කානු භාවිතාකර තිබිණි. ඒ වගේම 33%ක් ආරක්ෂිත ශාක සිටුවීම භූමි සංරක්ෂණ ක්‍රමයක් වශයෙන් අනුගමනය කර තිබිණි. තවත් 12%ක් වෙනත් භූමි සංරක්ෂණ ක්‍රම අනුගමනය කරන බව සඳහන් කරන ලදි. සමෝච්ච රේඛා අනුව වගා කිරීම දක්නට ලැබුණේ 3%ක් පමණි. මෙම තොරතුරුවලින් පැහැදිලි වන්නේ 70%කට වැඩි පිරිසක් කුමන හෝ ඉඩම් සංරක්ෂණ ක්‍රමයක් අනුගමනය කරන බවයි.
මෙම අධ්‍යයනයෙන් හෙලිකරගත් තවත් විශේෂ ලක්ෂණයක් වන්නේ 'ගෙවත්ත' සඳහා ඉඩමේ අයිතිය තීරක සාධකයක් වී නොමැති බවයි. පළවෙනි දෙවෙනි සහ තෙවෙනි පරම්පරා නියෝජනය කරන සෑම කුටුම්භ ඒකකයකම නිවස්නය අවට ගෙවත්තක් පවතී. ඒසේම එම ගෙවත්තේ ව්‍යාප්තිය නැතහොත් භූමි ප්‍රමාණය තීරණය කිරීම සදහා බොහෝවිට ඉඩමේ අයිතිය බලපා ඇතිබව පෙනේ. නෛතික

ඉඩම් අයිතිය ඇති බහුතරය තරමක් විශාල ගෙවතු වගා සඳහා යොමුවී ඇති බව පෙනෙන අතර අනවසර හෝ හවුල් ඉඩම් කරුවන් එලෙස ගෙවතු වගාවට යොමුවී ඇත්තේ අල්ප වශයෙනි.

මෙම දුර්වලතා අවම කිරීම සඳහා ගොවීන් විසින් ඉදිරිපත් කරන ලද උපාය මාර්ග මතු දැකිවේ. ඉඩම්වල අයිතිය පැවැරීම යටතේ බලපත්‍ර සවර්ණභූමි/ජයභූමි අයිතිය වෙනුවට සින්නකර බලපත්‍ර ලබාදීම, අනවසර ඉඩම් නියමානුකූල කිරීම, ඉඩම් හුවමාරුවට හෝ අලවියට අවසර ලබාදීම සහ ජලසම්පාදනය විදිමත් කිරීම සඳහා වගා ලිං ප්‍රමාණය වැඩිකිරීම සඳහා ආධාර කිරීම, වතුර මෝටර් සහන මිලට ලබාදීම, විධිමත් ජල කළමණාකරනය යන යොජනා ප්‍රදේශයෙන් යොජනා වී තිබිණි. ඊට අමතරව පහත සඳහන් යෝජනාවන් ඉදිරිපත් කළ හැකිය.

මහවැලි ඉඩම් ප්‍රථමයෙන් බලපත්‍ර ලෙසත් පසුව ස්වර්ණභූමි හෝ ජයභූමි ලෙසත් ඉඩම් ඔප්පු ලබා දී ඇත. එහෙත් ඒවායින් ගොවීන් අපෙක්ෂා කරන අයුරින් හුවමාරු කිරීමට හෝ විකිණීමට අවශ්‍යතාව පවතින බව දැක්වුවද එය තවදුරටත් අධ්‍යයනයට භාජනය කළ යුතු කරුණකි. කුඩා ඉඩම් හිමියන් තම ඉඩම් අලෙවි කිරීම තුලින් ඔවුන් ඉඩම් නොමැති අය බවටත්, ඉඩම මිලදී ගන්නා පුද්ගලයා මහා පරිමාණ හෝ මධ්‍ය පරිමාණ හිමියකු බවට පරිවර්ථනය වීමේ හැකියාව පවතී. එහෙයින් මෙම තත්වයන් පිළිබඳව සළකා ගොවියන්ට ඇපයක් ලෙසට භාවිතා කළ හැකි අයුරින් හෝ ණය මුදලක් ලබා ගැනීමට ඉදිරිපත් කළ හැකි අයුරින් නීති සැකසීම වැදගත් වේ. දැනට 'බිම් සවිය' යටතේ මේ පිළිබඳව අවධානය යොමු වී තිබීම වැදගත් වේ.

ඉඩම් මැනුම් කර ඊට අදාළ පිඹුරුපත්වල පිටපතක් ඉඩම් හිමිකරුවන්ට ලබාදීම වැදගත් වේ. ඒ මගින් අසල්වාසි ඉඩම් හිමියන් සමඟ ඇතිවන ආරවුල් අවම කරගැනීමටත්, ඉඩම් ඛණ්ඩනය සීමා කිරීමටත් හෙතුවිය හැකිය.

ඉඩම් හිමිකම සහ එම ඉඩම් ප්‍රසස්ත අයුරින් පරිහරණය කිරීම තුළ ධන සහසම්බන්ධතාවක් පැවතුණි. එයින් පැහැදිලි වන්නේ ඔනෑම කෘෂිකාර්මික ඉඩම තිරසර අයුරින් ප්‍රසස්ත ඵලදාවක් ලබාගැනීම සඳහා එකී කෘෂි කාර්මික භූමියේ අයිතියේ සුරක්ෂිතතාවය තහවුරු කිරීම ඉතා වැදගත් වන බව ය. ඒ අනුව කෘෂිකාර්මික බිම්වල නෛතික අයිතිය නොමැති මෙතෙක් ඉඩම් භුක්ති විදින ප්‍රජාව සඳහා ඉඩම් ලබාදීම මගින් ඔවුන් ආර්ථිකයට සිදුකරන දායකත්වය වර්ධනය කර ගැනීමේ සබ්‍යතාවයක් පවතින බව ප්‍රකාශ කළ හැකිය. ඒ මෙන්ම දැනට එවන් නෛතික අයිතියක් නොමැති, එහෙත් අනවසරයෙන් භුක්ති විදින අයගේ අයිතිය නියමානුකූල කිරීම තුළින් ද එය සිදුකළ හැකිය.

කෘෂිකර්මය සඳහා අවශ්‍ය රාජ්‍ය අනුග්‍රහය ද ලබා දෙමින් දෙවන පරපුරේ සාමාජිකයන් මුල් කොට ගත් විවිධ වැඩ සටහන් මගින් ඔවුන් දිරිමත් කිරීම, ණය

ලබා දීම, රසායනික පොහොර ලබා දීම හා අලෙවි පහසුකම් ඇති කිරීම, රාජ්‍ය අංශයේ මැදිහත් වීමෙන් කෘෂි අංශයේ සේවා නියුක්තිය වැඩි කිරීම.

රැකියාවන්හි නියුක්තිය හා ආදායම් ප්‍රමාණය පිළිබඳව අවධානය යොමු කිරීමේදී ප්‍රදේශයේ දැඩි විෂමතාවක් දක්නට නොමැති අතර විෂමතාව නිර්මාණය වීමට වැඩි වශයෙන් දායක වී තිබුනේ අනවසර පදිංචි කරුවන් බව පෙනේ. ඔවුන්ට ස්ථිර රැකියාවක් හෝ ගොවිතැන් කිරීම සඳහා කුඹුරු නොමැති වීම හේතු කොටගෙන ඔවුහු අඩු ආදායම් සඳහා හිමිකම් කියති. ඔවුන් සඳහා කෘෂිකර්මය පදනම් කොට කර්මාන්ත (Agro based industries) පිහිටුවීම මගින් සංවර්ධනයට දායක කරගත හැකි ය. වී නිෂ්පාදනය ආශ්‍රිත බඩ ඉරිඟු, සොයා, පළතුරු, එළවලු වැනි නිෂ්පාදන ආශ්‍රිත කර්මාන්ත පිහිටුවිය හැකි ය.

මීට අමතරව විවිධ වැඩ සටහන් මගින් කෘෂි ක්ෂේත්‍රය සමාජීය වශයෙන් තවමත් විශ්වාස දායක අයුරින් ජීවත් වීම සඳහා ප්‍රමාණවත් රැකියාවක් බවත් දෙවන පරම්පරාවන් මෙන් ම තුන්වන පරම් පරාවන් වලට පවා එහි නිසි ප්‍රතිලාභ ලබා ගත හැකි බව දැනවීම සඳහා වැඩසටහන් දියත් කළ හැකි ය.

### ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


අබේවර්ධන පී, සේනාරත්න ඒ. (2002) ස්වභාවික සම්පත් සහ පරිසර ආර්ථික විද්‍යාව, කතෘ ප්‍රකාශණ, කැස්බෑව

අභයසිංහ, ටිකිරිබණ්ඩා හේරත් (1996) පරංගි කොට්ටේ, කොළඹ.

අමරසේකර දයා (1988) ශ්‍රී ලංකා සමාජය, ආරිය ප්‍රකාශකයෝ, වරකාපොල.

අමුණුගම, සරත් (1999) සංස්කෘතිය සමාජය සහ පරිසරය, සදීපා පොත්හල, බොරැල්ල.

අයිවන්, වික්ටර් (1990) ශ්‍රී ලංකාවේ නූතන කැරලි කරුවන්ගේ සමාජ පසුබිම, සර්වෝදය ග්‍රන්ථ ප්‍රකාශකයෝ, රත්මලාන.

ආරියපාල ඇම්. බී. (1962) මධ්‍යයකාලීන ලංකා සමාජය, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, කොළඹ.

ඉඩම් අමාත්‍යංශය, (2007) ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් අංශය, ඉඩම් අමාත්‍යංශය, කොළඹ.

ඊරියගම, තිස්ස (1998) කාර්මික විප්ලවය, ජාතික අධ්‍යාපන පදනම, කොළඹ.